# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,911 - 2015 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා - 2015.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 554 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 556 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 557 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 561 |


*සැ. යු.* - විසිහතරවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**කලින් තෝරාගත් (Pre Selected) දුම්රිය ස්ථාන 24ක් සඳහා ජැනිටෝරියල් (Janitorial) සේවා සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

01. කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි, සභාපති විසින් කලින් තෝරාගත් (Pre Selected) දුම්රිය ස්ථාන 24ක් සඳහා ජැනිටෝරියල් සේවා සැපයීම අරභයා දැනට, රාජ්‍ය සහ /හෝ පෞද්ගලික අංශයේ සංවිධාන/ආයතන සඳහා ජැනිටෝරියල් (Janitorial) සේවා සැපයීම පිළිබඳව ප්‍රමාණවත් පළපුරුද්ද සහිත, පිළිගත් සමාගම් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු ආපසු ගෙවනු නොලබන රු. 2,500 ක් පමණක් වන ලිපිලේඛන ගෙවීමෙන් අනතුරුව 2015.04.29 වැනි දින ප. ව. 3.00 දක්වා, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාර ගැනීම 2015.04.30 වැනි දින ප. ව. 2.00 ට අවසන් වන අතර, එකී වේලාව ඉක්ම වූ වහාම කොළඹ 10, ඕල්කට මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට සහභාගි වන ලෙස, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

04. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදු කළ යුතු ය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය මූලස්ථානය,<br>
ඕල්කට් මාවත,<br>
කොළඹ 10.

05. ලංසු ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යලයේ දී, පරීක්ෂා කර බැලිය හැකි වන අතර, වැඩිදුර විස්තර සඳහා කරුණාකර පහත සඳහන් අය වෙතින් විමසනු මැනවි.

දුම්රිය ගබඩා අධිකාරි,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
ඕල්කට් මාවත, කොළඹ 10<br>
දුරකථන අංක : 2438078 හෝ 2436818.<br>
ෆැක්ස් අංකය : 2432044.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7239

04-542

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත 10,000 Nos. Base Plates to Suit 90 (A) Ibs. Rail Seat and Elastic clips ප්‍රසම්පාදනය**

01. කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) සභාපති විසින්, රාත්තල් 90 ශ්‍රී ලංකාවේ (A) රේල් සීට් (Rail Seat) සහ ඉලාස්ටික් ක්ලිප් (Elastic Clips) වලට ගැළපෙන බේස් ප්ලේට් (Base Plates) 10,000ක් මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින් විසින් ඍජුව හෝ ඇටෝර්නි බලපත්‍රයක් මගින් ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයින් මගින්, ලංසු ඉදිරිපත් කිරීමට පුළුවන.

02. 2015.05.08 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට ලංසු අවසන් කරනු ලැබේ.

03. ලංසු තබන්නන් විසින්, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල කාර්යාල වෙතින්, 2015.05.07 වැනි දින ප. ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ලබාගත හැකි, ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය. ආපසු නොගෙවන රු. 3,000 ක හෝ පහසුවෙන් හුවමාරු කළ හැකි සමාන මුදලකින් ආකෘති පත්‍ර ගාස්තුවක් ගෙවීම මත, ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු අවසන් කිරීමත් සමගම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, සාමාන්‍යාධිකාරීගේ කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු කරුවනට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හො අතින් ගෙනැවිත් බාරදිය හැක්කේ,

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10. ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලීමට පුළුවන. වැඩි මනත් විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,<br>
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10.<br>
ශ්‍රී ලංකාව.<br>
දුරකථන අංක : 94(11) 2438073 හෝ 94 (11) 2436818,<br>
ෆැක්ස් අංක : 94 (11) 2432044.<br>
ඊමේල් : srs.sli@gmail.com<br>
වෙබ් අඩවිය :www.slrail.info

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7223

04-543

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

රත්මලාන දුම්රිය අංගනයෙහි ඇති ගර්හිත වැගන් සහ එන්ජින් අපහරණය කිරීම

අංක SRS/F. 7200

01.රත්මලාන දුම්රිය අංගනයෙහි ඇති ගර්හිත වැගන් සහ එන්ජින් අපහරණය කිරීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි, දුම්රිය මූලස්ථානයෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන) සභාපති විසින් භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම 2015.04.28 වැනි දින ප.ව . 2.00 ට අවසන් වේ.

03. ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලය වෙත ගෙවිය යුතු ආපසු ගෙවනු නොලබන රු. 5,000 (රුපියල් පන්දහසක් පමණයි) මුදල ගෙවීමෙන් කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් 2015.04.27 වැනි දින පස්වරු 3.00 දක්වා ලබාගත හැකි පෝර්මවල ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කිරීම සිදුකරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණෙන ලෙසට ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

07. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී මුදල් ගෙවීමකින් තොරව සිදුකළ හැකිය.

08. මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරිගෙන් විමසන්න.

දුරකථන අංක : 2438078/2436818,
ෆැක්ස් අංකය : 2432044,
ඊමේල් : srs.sli@gmail.com
වෙබ් අඩවිය :www.slrail.info

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7200

04-544

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන කමිටුව

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට 5,000 Pairs of Six Holed Fish Plates 90A Ibs. සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

01. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන/Major) හි, සභාපති විසින් 5,000 Pairs of Six Holed Fish Plates 90A Ibs) මිලයට ගැනීම සඳහා, නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

ලංසුකරුවන්ට, ඇටර්නි බලය පැවරීමෙන් බලය පවරන ලද, සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ස්වකීය බලයලත් නියෝජිතයෙකු මගින් හෝ සෘජුවම හෝ සිය ලංසු ඉදිරිපත්කළ හැකි ය.

02. ලංසු රු. 3,000 පමණක් වන පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් ඊට සමාන මුදලක් මගින් හෝ වන ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2015.05.06 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා, විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙතින් හෝ, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් ලබාගත හැකි, ආකෘති පත්‍ර (පෝරම) වල පමණක් ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාර ගැනීම, 2015.05.07 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් වනු ඇත.

04. Six holed Fish Plates 90A Ibs, සැලසුම් නිර්මාණය, නිෂ්පාදනය හා සැපයීම ISO 9001 : 2008 සහතික ලත් හෝ ගැණුම්කරුට පිළිගත හැක සමාන අන්තර්ජාතික තත්ත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිති සහතික ලත් සමාගම් විසින් භාරගෙන ඉටුකළ යුතු ය.

05. ලංසු එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා මූල්සථානයේ දී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (ප්‍රධාන/Major),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

07. ලංසු ලිපිලේඛන, ගාස්තු ගෙවීමෙන් තොරව, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි වන අතර, වැඩිදුර විස්තර මතු සඳහන් අය වෙතින් විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ඊමේල් :ඊමේල් : srs.sli@gmail.com
වෙබ් අඩවිය :www.slrail.info

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7219
04-545

# බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය -කොළඹ**

**කොළඹ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කොළඹ මහාධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ග 2015.05.16 වැනි දින පැය 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ වෙන්දේසිය ආරම්භ කිරීමට නියමිත වේලාවට පැය භාගයකට කළින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන පරීක්ෂා කළ හැකි ය.

03. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් එදින පැය 9.45 පෙර ස්වකීය හිමිකම් මෙම අධිකරණය වෙත තහවුරු කළ යුතු ය.

04. වෙන්දේසියේ මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදී ම මුදල් ගෙවිය යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

05. අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා වෙනත් හේතුන් මත එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ බලය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර මිලදී ගන්නා භාණ්ඩ එදින පැය 16.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එස්. ද එල්. තෙන්නකෝන්,
මහාධිකරණ විනිසුරු,
කොළඹ.

2015 මාර්තු මස 31 වැනි දින,
කොළඹ මහාධිකරණයේ දී ය.

**උපලේඛනය**

01. HC 5546/11
- 01. L. G. රූපවාහිනී හා දුරස්ථ පාලකය
- 02. සෝනි වර්ගයේ පරිගණක 01
- 03. මොනිටර් 01
- 04. කී බෝඩ් 01
- 05. L. G. D. V. D. 01
- 06. L. G. බඟල් 01
- 07. L. G. කුඩා ස්පීකර් 05
- 08. රිමෝට් 01
- 09. M. F. S. 40 බැටරි 01

02. HC 6473/13
- 01. ලැප්ටොප් පරිගණක 01
- 02. පෙන් 01යි

03. HC 6984/13
- 01. HP 4 ආම්වරය නොමැති වතුර මෝටර් 10
- 02. HZ 60 ආම්වරය සහිත වතුර මෝටර් 24
- 03. HP 1 ආම්වරය නොමැති වතුර මෝටර් 174
- 04. HP 1 ආම්වරය සහිත වතුර මෝටර් 13
- 05. පරණ යකඩ ප්‍රමාණයක්

04. HC 7141/14
- 01. ප්ලාස්ටික් බූලි 03

05. HC 2519/05
- 01. මධ්‍යම සැකසුම් ඒකකය
- 02. PJ 84550846 මොනිටරය
- 03. K. B. 9810 යතුරු පුවරුව
- 04. A 638 ප්‍රින්ටරය
- 05. මවුස් 01
- 06. CD 5120 E CD
- 07. මදර් බෝඩ් 01
- 08. CPU පොසෙසර් 01
- 09. මල්ටි ප්ලග් 01
- 10. වයර් කෝඩ් 01
- 11. CPU ආවරණය

06 HC 7516/14
- 01. අච් කණ්නාඩි 01
- 02. අත් ඔරලෝසු 04

07. HC 7200/14
- 01. USB චාජර් 01
- 02. හැන්ඩ් ෆ්‍රී 01
- 03. ලේසර් පන්දම් 01
- 04. කැල්කියුලේටර් 02
- 05. දුර දක්න 01
- 06. ග්‍රීන් ලේසර් පොයින්ටර් 01
- 07. මුදල් ගනින යන්ත්‍රය
- 08. ලේසර් කිරණ පහන් 01
- 09. ටූල් කිට් 02
- 10. ෆෝන් වෙත භාවිතා කරන දුරදක්නය
- 11. හෙඩ් පෝන් 01
- 12. බ්ලූටූත් සබ්වූපර් ලේසර් 01
- 13. ඩේටා කේබල් 02
- 14. ටූල් කිට් 01
- 15. මිනි ටේබල් ලයිට් 01
- 16. අච් කණ්නාඩි 01

08 HC 6963/13
- 01. හෙල්මට් 01
- 02. විදුලි තරාදියක්

09. 7074/13
- 01. පොලිතින් සීලර් 01
- 02. විදුලි තරාදියක්

10. HC 7045/14
- 01. ත්‍රීරෝද රථය 202-4938

11. HC 6179/12
- 01. රන් පැහැති අත් පළඳනා 01යි

12. HC 6181/12
- 01. රන් පැහැති චේන් 01යි

13. HC 6182/12
    01. රන් පැහැති අත් පළඳනා 01යි

14. HC 6188/12
    01. රන් පැහැති චේන් 01යි

15. HC 6189/12
    01. රන් පැහැති චේන් 01යි

16. HC 6190/12
    01. රන් පැහැති අත් පළඳනා 01යි

17. HC 6322/12
    01. රන් පැහැති අත් පළඳනා 01යි

18. HC 6324/12
    01. රන් පැහැති අත් පළඳනාව 01යි

19. HC 5789/11
    01. ගල් අල්ලන ලද රන් පැහැති මුදු 01යි

20. HC 7516/14
    01. රිදී පැහැති මුද්දක්, පෙන්ඩනය, අත්පළඳනාව

21. HC 5483/13
    01. තරාදි 01ක් හා පඩි 03ක්

04-648

# රජයේ නොවන දැන්වීම්

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබේ.

සමාගමේ නම : CENTRA EXPORTS (Private) Limited
PV No. PV 96577
දිනය : 2014.01.20
ලේකම් : C. M. Consultant Pvt Ltd.

04-466

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : නම්බිකායි ඔලි (ගරන්ටි)ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : ජී එල් 2326
ලියාපදිංචි කළ දිනය : 2015.03.23
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කුඩත්තෙන්නායි බටහිර, කුඩත්තෙන්නායි

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු. 011 5922126

04-470

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සිසිල ස්පා (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 104376
ලියාපදිංචි කළ දිනය : 2015.03.11
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 674/7, වැව පාර, බොරලැස්ගමුව

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු. 011 5922126

04-471

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : කසුන් ඉන්වෙස්ට්මන්ට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 104391
ලියාපදිංචි කළ දිනය : 2015.03.12
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 55, කසුන්ගම, මැටියගනේ, නාරම්මල.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු. 011 5922126

04-473

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : දිවි ශක්ති මයික්‍රෝ ක්‍රෙඩිට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 104631
ලියාපදිංචි කළ දිනය : 2015.03.20
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 119/8, කුරුණෑගල පාර, දිවුලපිටිය.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු. 011 5922126

04-474

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාර එච් එෆ් සිලෝන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2014 නොවැම්බර් මස 4 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දන්වා සිටිමු.

ලියාපදිංචි අංකය : PV 101933
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 231, මීගමු පාර, රිළවුල්ල, කඳාන.

අධ්‍යක්ෂ.

04-489

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් චන්දිමා වෙල්ගම මහත්මිය විසින් වර්ෂ 2013 ඔක්තෝබර් මස 15 වැනි දින ලියා සහතික කරන ලද අංක 1619 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි අධිපති වන දොම්පේ, ඉන්දොලමුල්ල ශ්‍රී මහා විහාරය, අංක 304 දරන ස්ථානයේ පදිංචි ඉන්දොලේ පඤ්ඤාරතන හිමි වන මා විසින් පූගොඩ දිසා අධිකරණ අංක 1241/එල් නඩුවෙහි කටයුතු කරගෙන යාම සඳහා ලෙනගම්පල, ලෙනගම්පල පුරාණ විහාරය, අංක 11 හි පදිංචි පොල්ලමුරේ සීවලී හිමි යන අයට ලබා දී තිබූ බලය මෙයින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට එකී නඩුව සම්බන්ධයෙන් ඔහු විසින් යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් මා විසින් නොදරන බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බවත් මෙයින් සියල්ලන්ටම දැනුම් දෙමි. 2015 මාර්තු මස 20 වැනි දින සිට.

ඉන්දොලේ පඤ්ඤාරතන හිමි.

04-495

## වී එස් ආර් එන් සෝලර් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම් දීම.

2015 මාර්තු මස 13 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 104446 යටතේ වී එස් ආර් එන් සෝලර් පවර් (ප්‍රයිවට්) ලිමටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 03, ඩීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය) හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

04-501

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

වෙන්නප්පුව ශාන්ත ජෝශප් මාවත ලිපිනයෙහි පදිංචි රතුගමගේ ජෙරාඩ් සැම්සන් ප්‍රනාන්දු වන මා විසින් වෙන්නප්පුව ශාන්ත ජෝශප් මාවතේ අංක 457 ස්ථානයේ පදිංචි කුලසේකර ගනිහිගම අප්පුහාමිලාගේ ජගත් කුලසේකර යන අය වෙත ප්‍රදානය කළ 2000.09.09 දිනැති අංක 17506 දරන එන්. පී. ඩෙන්සිල් පොන්සේකා මහතා විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

රතුගමගේ ජෙරාඩ් සැම්සන් ප්‍රනාන්දු.

04-535

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : Oriens Global Marketing (Pvt) Ltd
සමාගම් අංකය : PV 74906
සංස්ථාගත කළ දිනය : 2011.05.26
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 174, ක්‍රිස්ට් පෙරේරා මාවත, කොළඹ 13.

කළමණාකාර අධ්‍යක්ෂ,
එස්. ජෙයරාම්.

04-536

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 13, සිරිල් සී පෙරේරා මාවත, අංක 36 දරන ස්ථානයේ පදිංචි සෙල්ලහේවාගේ බන්දුසේන සහ තිරුමගල් අයිරාංගනී බන්දුසේන වන අපි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්,

අප විසින් අපගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් වත්තල, ඔලියමුල්ල නවලෝක උද්‍යානපුර, අංක 36/15 ඒ දරන ස්ථානයෙහි පදිංචි, ලාල් ගුණතිලක අය පත් කරමින් දෙන ලද අංක 1403 සහ 2009.08.01 දින දරන එම්. ඒ. රොෂාන් ප්‍රසාද් සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ලිඛිත බලධාරිකම් සහ ඇටර්නි බලපත්‍ර පොතේ 6 කාණ්ඩයේ 72 පත් ඉරුවේ 2089 දින පොත් අංකය යටතේ 2009.08.27 දාතම ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවටත් මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

සෙල්ලහේවාගේ බන්දුසේන,
තිරුමගල් ඉරන්ගනී බන්දුසේන.

2015 පෙබරවාරි මස 23 වැනි දින.

04-538

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය පරිදි) පහත සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2015.03.24 වැනි දින ලියාපදිංචි කළ බව මහජනතාව වෙත මෙයින් දන්වමු.

සමාගමේ නම : ෂයිනින් කලර් ප්‍රින්ටින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : PV 104704
ලියාපදිංචි කාර්යාලය : අංක 608 -9-11 බේස්ලයින් පාර, දෙමටගොඩ, කොළඹ 09.

04-539

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැලිගම, අලුත් වීදිය, අංක 254A, දරන ස්ථානයෙහි පදිංචි මොහමඩ් ෆලුලුන් මොහමඩ් වසීම් වන මා විසින් මාතර දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් එම්. යූ. එම්. මුන්සිර් මහතා විසින් ලියා සහතික කළ අංක 26 සහ 2003.08.03 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැලිගම, අලුත් වීදිය, අංක 254ඒ, දරන ස්ථානයෙහි පදිංචි මොහමඩ් ෆලුලුන් අබ්දුල් හමීල් වන අයට පවරා තිබූ ඇටෝර්නි බලතල මෙමගින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

මොහමඩ් ෆලුලුන් මොහමඩ් වසීම්.

04-540

## ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

අළුත්ගම ගනේගම ඩිපෝ පාරේ 392/1 හි "අරුණ" පදිංචි කළුතරගේ සරත් ආනන්ද ප්‍රනාන්දු (ජා. හැ. අංක 590511439 V හිමි) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් කුයින්ටස් ඒ. ආර්. කුරේ විසින් සහතික කරන ලදුව දෙල්කඳ නුගේගොඩ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන අංක 4425 දරන දින පොතෙහි පත් ඉරු 116හි වෙලුම 69 හි 1991.06.12 වැනි දින ලියාපදිංචි කර ඇති ශ්‍රී ලංකාවේ අලුත්ගම ගනේගම ඩිපෝ පාරේ "අරුණ" පදිංචි හෙට්ටිආරච්චිගේ දෝන මාලා මංගලිකා සිරිමාන්න (ජා. හැ. අංකය 635131101 V) හිමි වෙත ප්‍රදානය කර ඇති අංක 3546 හා 1991.06.12 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එයට මාගේ වගකීමක් නොමැති බවත් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ එහි මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

කේ. සරත් ආනන්ද ප්‍රනාන්දු.

04-541

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මඩකලපුව වීදිය, කල්කුඩා වාලච්චේනයේ පදිංචි ඉලංකෝ ලෝහිදරාජා (ජා. හැ. ප. අංකය 622081393 V ) යන මා මඩකලපුව වීදිය, කල්කුඩා යන ලිපිනයේ පදිංචි කන්දප්පර් තිරුමාල් (ජා. හැ. ප. අංකය 572433234 වී) යන අයට ලබාදුන් ප්‍රසිද්ධ නොතාරිස් එම්. බී. එම්. හුසයින් යන මහතා විසින් සහතික කරන ලද අංක 6548 සහ 2007.08.19 වන දිනැති විශේෂ ඇටෝර්නි බලය ද, කුම්බුරුවැල්ල වීදිය, කල්කුඩා මඩකලපුව යන ලිපිනයට අයත් එම්. එස්. වේල්මුරුග සිවරෙඩිනම් (ජා. හැ. ප. අංකය 5780224492 V) සහ තිරුමාල්, ජෙයසුදා යන අයවලුන්හට ලබාදුන් ප්‍රසිද්ධ නොතාරිස් පී බාලසුන්දරම් යන මහතා විසින් සහතික කරන ලද අංක 923 සහ 2010.07.12 දිනැති විශේෂ ඇටෝර්නි බලය ද මෙයින් අවලංගු කරමි.

ඉදිරියේ දී 2015.03.10 වැනි දින සිට මාගේ ඇටෝර්නි බලතලය මගින් සඳහන් කරන ලද පුද්ගලයින් විසින් සිදු කරනු ලබන ගනුදෙනු වලට මා වගහාර නොගන්නා බව සඳහන් කර සිටිමි.

ඉලංකෝ ලොහිදරාජා
Schaffhauserstr 463
8052 Zurich Switzerland
Tel : 004143 5366614, Mob : 0041765688732
10.03.2015

2015.03.24 දින දිනමිණ පුවත්පතෙහි පළ වූ ඉහත දැන්වීමෙහි, අදාල ඇටර්නි බලපත්‍රයෙහි සඳහන් අංකය 9548 ලෙස ප්‍රමාද දෝෂයකින් සඳහන්ව ඇති අතර, එය 6548 ලෙසට නිවැරදි විය යුතු බව සැලකිය යුතුය.

04-554

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාරව -

සමාගම් නාමය : ජියොං ඉන් ක්වාට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 63535
ලියාපදිංචි කාර්යාලය : අංක 994, අයිඩීඑච් පාර, ගොතටුව.

04-560

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කැකිරාව, තිබ්බටුවැව, "වැව්සිරි" යන ස්ථානයේ පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. එස්. බණ්ඩාර ඉලංගසිංහ මහතා විසින් වර්ෂ 2011.05.20 වැනි දින ලියා සහතික කළ අංක 111 දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාර කැකිරාව, මාණක්කඩවල දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අංක 761160460 V දරන අරුණ සම්පත් කුමාර රාජකරුණා වන මා විසින් කැකිරාව, මාන්කඩවල, අංක 24 ඒ දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අංක 780070714 V දරන චන්ද කුමාර රාජකරුණා යන අයට ලබා දී තිබූ ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් එකී ලේඛනය මෙතැන් පටන් බලපැවැත්මක් නොවන බවත් සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

අරුණ සම්පත් කුමාර රාජකරුණා.

04-561

---

## දැන්වීමයි

සීමාසහිත වාර්ටිස් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම

2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (ආ) වගන්තිය යටතේ සමාගම ඇවර කිරීමට යෝජනා කරමින් සීමාසහිත වාර්ටිස් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගමේ කොටස් හිමිකරුවන් විසින් 2015 අප්‍රේල් මස 10 වැනි දින විශේෂ යෝජනාවක් සම්මත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2015 අප්‍රේල් මස 10 වැනි දින.

04-563

---

## ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීව පහත සඳහන් සමාගම 2014 මාර්තු මස 24 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සැලෝන් මැනේජ්මන්ට් ඇන්ඩ් සප්ලයර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 97766
ලිපිනය : අංක 41, රිජ්වේ පෙදෙස, කොළඹ 04

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩල්සි කල්‍යාණි අභයගුණවර්ධන.

04-579

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 16 ජාලන් කිලාන් හෝයි හප් බිල්ඩිං සිංගප්පූරුව 159416 පදිංචි චාන් එවේ ජින් (NRIC NO. S 2563493D) වන මා 2011.10.10 දින ලී මින් සෙන් ප්‍රසිද්ධ නොතාරිස් සිංගප්පූරුව සහතික කරන ලද අංක 120 දරන ඇටෝර්නි බලය අංක 5 5/4 ශාන්ත ලෝරන්ස් පාර, කොළඹ 06 ශ්‍රී ලංකාව පදිංචි පාර්තිබන් ආරියරත්නම් (ගුවන් බලපත්‍ර අංක එන් 1439932) මහතාට පවරා තිබුණ ඇටෝර්නි බලය 2014 ජූලි මස 04 වැනි දින අවලංගු කල බවත්, මින් ඉදිරියට ඉහත සඳහන් පුද්ගලයා සමග සිදු කරන කිසියම් කටයුත්තකට වග නොකියන බවත්, වලංගු නොවන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාවට දැනුම් දෙමි.

චාන් එවේ ජින්

2015 ජනවාරි මස 14 වැනි දින.

04-596

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : රදැල්ල ඉංජිනියරින් ඇන්ඩ් අර්ත් මුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 104076
ලියාපදිංචි ලිපිනය : අංක 258, හැව්ලොක් පාර, කොළඹ 04.

සමාගම් අධ්‍යක්ෂකවරු.

04-601

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ස්නැප් ෆෙර්ඩ් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 104542
ලියාපදිංචි ලිපිනය : අංක 260/24A,, ඩිපෝව පාර, කටුබැද්ද, මොරටුව

සමාගම් අධ්‍යක්ෂකවරු.

04-602

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ක්‍රියේටිව් එන්ටර්ටේන්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 65135
ලියාපදිංචි ලිපිනය : අංක 06/1 A, ගාලු පාර, පින්වත්ත, පානදුර.

සමාගම් අධ්‍යක්ෂකවරු.

04-603

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : සෙවණ මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PB 5248
ලියාපදිංචි ලිපිනය : අංක 7/2, දෙවන පටුමග, සුභද්‍රාරාම පාර, නුගේගොඩ.

සමාගම් අධ්‍යක්ෂවරු.

04-604

### නිවේදනයයි

ඇඩ් ඉන්ෆිනිටි සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 2015 මාර්තු මස 26 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඇඩ් ඉන්ෆිනිටි සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104750
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 90, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

සී. ජී. ජයවීර බණ්ඩාර,
සමාගම් ලේකම්.

04-655

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙහිවල වෛද්‍ය පාර, අංක 26/83 සී දරන ස්ථානයේ පදිංචි ජසෙන්තු ලියන ආනන්දසිරි ප්‍රනාන්දු වන මම ප්‍රසිද්ධ නොතාරිස් ඇම්. පී. බටුවන්තුඩාව මහත්මිය විසින් 2014ක් වූ මැයි මස 13 වැනි දින සකස් කරන ලද අංක 2211 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී මාලබේ, වැලිවිටපාර, පළමු වන පටුමග, අංක 15 එෆ් දරන ස්ථානයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ බුද්ධික ගයාන් කුමාර ගොඩමුණේ මහතා වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් අහෝසි කර අවලංගු කරන බවත්, එකී ඇටෝර්නි බලකරු විසින් සිදුකරන ලද කිසිදු ගණුදෙනුවකට මින් ඉදිරියේ දී මා විසින් වග නොකියන බවටත් සමාජවාදී ජනරජයටත්, පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ජසෙන්තු ලියන ආනන්දසිරි ප්‍රනාන්දු.

04-649

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

දෙමටගොඩ, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ පිහිටි "ගෝල්ඩන් එන්ක්ලේව් ඇස්කොන් රෙසිඩන්සීස්" නම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ 3 වැනි මහලේ පිහිටි සහාධිපත්‍ය XA/F3/U9 ඒකකය වරිපනම් අංක 608/3/9 දරන පරිශ්‍රය තුළ පිහිටි වර්ග මීටර් 100ක් විශාලැති අගනා සහාධිපත්‍ය නිවස.

බලයලත් මානක ගාමිණී බී දොඩංවල විසින් සාදන ලද 2004.12.21 වැනි දිනැති සහාධිපත්‍ය පිඹුරු අංක 5195 හි දක්වා ඇති දෙමටගොඩ, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ පිහිටි "ගෝල්ටන් එන්ක්ලේව් ඇස්කොන් රෙසිඩන්සීස්" නම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ පිහිටි සහාධිපත්‍ය XA/F3/U9 - 3 වන මහලේ පිහිටි ඒකකය අදාළ පොදු පහසුකම් ද ඇතුළුව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිය යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන කොළඹ 03 සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන පීසී ෆාර්මා පීඑල්සී (කලින් පීසී ෆාර්මා ප්‍රයිවට් ලිමිටඩ් සහ ෂහිදුල් හිජිරි මොහමඩ් රිෂාන් අංක 1128 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති බැවින්, ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2015ක් වූ මැයි මස 8 වැනි දින පෙ. ව. 10.30 කණිසමට ඉහත කී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2014.05.09 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2014.04.29 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" සහ "තිනකුරල්" පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ට වන මාර්ගය.* - මෙම දේපළ දෙමටගොඩ දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ ගුවන් පාලම ඉදිරිපිට පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙහන් රු. 3,000ක් ද වේ. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777 - 672082 ෆැක්ස් අංකය 2871184.

04-555

---

**මහජන බැංකුව - අධි ශ්‍රේණිය ශාඛාව - කුරුණෑගල**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළ වෙන්දේසියේ විකිණීම

*1 වන ඉඩම .-* වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ, රත්කරව්ව ගමෙහි පිහිටි ගෝනපනේ කුඹුර සහ ඊට යාවූ පිල්ලෑව නමැති ඉඩමට 1997.10.20 වැනි දින බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර මහතා විසින් මැන සාදන ලද අංක 5852 A දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් මහතා විසින් 2004.02.03 වැනි දින එකී අංක 5852 ඒ දරන පිඹුර මතම කොටස් 03 කට බෙදා වෙන් කරන ලදුව ඉන් කැබලි අංක 1 A දරන ඉඩම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්කර 01, රූඩ් 0, පර්චස් 04

ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග සහ එකී අංක 5852 A දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 සී අංක 5244 දරන පිඹුරේ කැබලි අංක 02 A සහ 5244 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රවේශ මාර්ග පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිය ද සමග.

*2 වන ඉඩම.-* වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ කුඩාගල්බොඩ කෝරළේ, රත්කරව්ව ගමෙහි පිහිටි ගෝනපනේ කුඹුර සහ ඊට යාවූ පිල්ලෑව නමැති ඉඩමට 1997.10.20 වැනි දින බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර මහතා විසින් මැන සාදන ලද අංක 5852 A දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් මහතා විසින් 2004.02.03 වැනි දින එකී අංක 5852 A දරන පිඹුර මතම කොටස් 03කට බෙදා වෙන්කරන ලදුව ඉන් කැබලි අංක 1 බී දරන ඉඩම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 02 පර්චස් 06

ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග සහ එකී අංක 5852 ඒ දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 සී අංක 5244 දරන පිඹුරේ කැබලි අංක 02 ඒ සහ 5244 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රවේශ මාර්ග පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිය ද සමග.

*3 වන ඉඩම.-* වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ පුත්තලම පාරේ පිහිටි කඳුබොඩ හේන දැනට වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතා විසින් මැන සාදන ලද අංක 87/94 සහ 1994.05.16 දිනැති පිඹුරේ සඳහන් ලොට් 02 දරන ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ්. 0 පර්. 08

ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග

මහජන බැංකුව විසින් අපවෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 මැයි මස 13 වැනි බදාදා දින 03 වන ඉඩම පෙ. ව. 11.00 ට සහ 01 වන සහ 02 වන ඉඩම් මධ්‍යාහ්න 12.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම.* - 01 වන සහ 02 වන ඉඩම්.- කුරුණෑගල නගරයේ සිට පුත්තලමට යන මාර්ගයේ සැතපුම් 04 ක පමණ දුර ප්‍රමාණයක් රත්කරව්ව හන්දිය දක්වා ගොස් එතැන් සිට තව එම පාරේ ම මීටර් 200ක් පමණ ගොස් දකුණට හැරී පාරට වෙන්කරන ලද කොටසට තවත් මීටර් 100ක් පමණ යන විට අදාළ දේපළ එකී පාරේ දකුණු පසින් පිහිටා ඇත.

*03 වන ඉඩම.-* කුරුණෑගල නගරයේ (ඔරලෝසු කණුව හන්දිය) සිට පුත්තලමට යන මාර්ගයේ සැතපුම් 1/2 ක පමණ දුර ප්‍රමාණයක් යන විට අදාළ දේපළ හමුවේ. එකී දේපළ එකී පාරේ දකුණු පස සුමංගල හන්දිය පසුකර මීටර් 100ක් පමණ යනවිට පිහිටා ඇත.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2013.04.19 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2013.05.16 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - එක් එක් වෙන්දේසිය අවසානයේ මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 1%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

එක් එක් වෙන්දේසියේ ගැනුම් මිලෙන් 90%ක් (සියයට අනූව)' ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, අංක 03, වත්තිමි පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතු වේ. දුරකථන 037- 2222572, 037 2231352 ෆැක්ස් අංකය 037 - 2225400.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිවල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

"ඉහත වෙන්දේසි පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

04-594

---

## ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී
(කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 296 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙපත්තු කරුන්කොඩිතිවු පිහිටි බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : උතුර සිට දකුණට : බඹ 7 3/4 (අඩි 45)
නැගෙනහිර සිට බටහිරට බඹ 18 (අඩි 108)

වර්තමානයේ, නැගෙහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සහ අක්කරෙපත්තු නගර සභා සීමාවට අයත්, කරුන්කොඩිතිවු කොට්ඨාස අංක 4 හි පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ජී. මොහොමඩ් තෛයූබ් විසින් සාදන ලද 2011 ඔක්තෝබර් මස 15 වැනි දිනැති අංක MT/403/11 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් පහළවයි දශම දෙකයි
(අක්. 0 රූඩ් 0 ප්. 15.2 හෙවත් හෙක්ටයාර 0.0385)

එහි පිහිටි සියල්ල සහ ඉහත කී අංක MT/403/11 දරන පිඹුර හරහා වැටී ඇති මාර්ග අයිතිය සමග අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් සසිකා නිරෝෂිණි සෙක්ස්ටස් ද සිල්වා විසින් සහතික කරන ලද 2011 ඔක්තෝබර් මස 28 දිනැති අංක 296 දරන උකස්කරය ප්‍රකාර, අක්කරෙපත්තුවේ ජවුසන් නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන ආදම් ලෙබ්බේ තාහා සිරාජුඩීන් විසින් ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී (කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව) ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ.

ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 මැයි මස 06 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් එක් එක් විකුණුම් සඳහා වෙන වෙනම පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු යː-

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාර)
4. රු. 122,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය"

ෂොක්මන් සහ සමරවික්‍රම,

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

04-607

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ප්‍රධාන කාර්යාල (එෆ්. සී. බී. යූ)**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2011.02.25 දිනැති අංක 4012 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එම්. සැම්සන් සිල්වා සහ කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2015 ක් වූ මැයි මස 13 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.* - බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ බොරලැස්ගමුව උප කාර්යාල සීමාවේ බොරලැස්ගමුව පිහිටි ඉන්දිරප්පුගේකුඹුර සහ ඇලබොඩකුඹුර නමැති ඉඩමට බලයත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් මැන සාදන ලද 2001.07.02 දිනැති අංක 1089 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 1 ලෙස සලකුණු කළ ඉඩම සහ ඊට අයත් සියලු දේත්. විශාලත්වය අක්කර දෙකක් (අ. 2 රූ. 0 පර්. 0).

ඉහත කී බොරලැස්ගමුව පිහිටි ඉන්දිරප්පුගේ කුඹුර සහ ඇලබොඩකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් මැන සාදන ලද 2001.07.02 දිනැති අංක 1089 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 2 ලෙස සලකුණු කළ ඉඩම සහ ඊට අයත් සියලු දේත්, විශාලත්වය අක්කර දහයයි රූඩ් දෙකයි පර්චස් තිස්තුනයි දශම පහක් (අ. 10, රූ. 2, පර්. 33.5).

ඉහත කී බොරලැස්ගමුව පිහිටි ඉන්දිරප්පුගේකුඹුර සහ ඇලබොඩකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් මැන සාදන ලද 2001.07.02 දිනැති අංක 1089 දරන පිඹුර ප්‍රකාර බෙදාවෙන් කරන ලද ලොට් ඒ 3 ලෙස සලකුණු කළ ඉඩම සහ ඊට අයත් සියලු දේත්. විශාලත්වය රූඩ් දෙකයි පර්චස් විසිහතරයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 24.50).

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.08.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.08.07 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ කොටුව සිට ගාලු පාර, දෙහිවලට ගමන් කිරීමෙන් ද, හොරණ පාරේ පාමංකඩ හරහා බොරලැස්ගමුවට ගමන් කිරීමෙන් ද මෙම දේපළට ළඟාවිය හැකි ය. දෙහිවලින් නැදිමාල බොරලැස්ගමුව පාරේ බෙල්ලන්විල රජමහා විහාරය පසුකොට කි. මී. 3 කණුව දක්වා ගොස් දකුණු අත පැත්තේ පාරට මායිම්ව බෝක්කුවට සහ ඇලට යාබදව පිහිටා ඇත. බොරලැස්ගමුව හන්දියේ සිට දෙහිවල පාරේ බෙල්ලන්විල රජමහා විහාරයට ලඟාවීමට ප්‍රථම ඇති විකල්ප ප්‍රවේශයක් ද වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.

04-605

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොට්ටාව ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැනක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2010.03.08 අංක 3619 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වීරක්කොඩිගේ හර්ශන දීපාල් අල්විස් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2015ක් වූ මැයි මස 07 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය 1 .-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිපිටිය හි පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් මැන සාදන ලද 2006.06.15 වැනි දින සහ අංක 6313 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් සී ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 2.60)

2. ඉහත කී හිරිපිටිය හි පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් මැන සාදන ලද ඉහත කී අංක 6313 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඩී ලෙස සලකුණු කළ ඉඩම් සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය රූඩ් එකයි පර්චස් අටයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 8.20)

3. ඉහත කී හිරිපිටිය හි පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් මැන සාදන ලද ඉහත කී අංක 6313 දරන පිඹුර ප්‍රකාර බෙදාවෙන් කරන ලද ලොට් ඊ ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් දාහතරක් (අ. 0, රූ. 0, පර්. 14)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.09.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.09.23 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොට්ටාව නගර මධ්‍යයේ සිට (කොළඹ කොටුවේ සිට හයිලෙවල් පාරේ කි. මී. 19.5ක් ඔබ්බට) පොල්ගස්ඕවිට පාරේ මත්තේගොඩ හන්දිය දක්වා කි. මී. 1.7ක් ගමන් කොට, හොරණ පාරට වමට හැරී මීටර් 900ක් දුරක් ගොස් (දොලේ කඩේ හන්දියට මීටර් 250ක් පමණ මෙපිටින්) නැවත වමට හැරී බෝගහවිල පාර නමැති තාර දමා ඇති මාර්ගයට (වීරක්කොඩි යකඩ බඩු වෙළඳපලට විරුද්ධ දිසාවට) මීටර් 150ක පමණ දුරක් ගමන් කර, අවසන් වශයෙන් තාර/ගුරු පාරට වමට හැරී මීටර් 250ක් පමණ ගියවිය දකුණු අත පැත්තේ ඇති පන්නිපිටිය හිරිපිටිය බෝගහවිල පාරේ පරිශ්‍ර අංක 37 සහ 37/1 වශයෙන් මෙම දේපළ හැඳින්වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.

04-606